ඌව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
ஊவா மாகாண கல்வித் திணைக்களம்
Uva Provincial Department of Education

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය -2025 පෙරහුරු ප්‍රශ්න පත්‍රය

11 ශ්‍රේණිය	44 S I	නැටුම් (දේශීය) - I	කාලය - පැය 01 යි

★ **සියළුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.**

★ **අංක 01 සිට 40 තෙක් ප්‍රශ්නවලට දී ඇති 1, 2, 3, 4 වරණ අතරින් නිවැරදි හෝ, වඩාත් ගැලපෙන හෝ පිළිතුර තෝරන්න.**

★ **අංක 01 සිට 10 තෙක් ප්‍රශ්නවල හිස්තැනට සුදුසු වචනය තෝරන්න.**

01. රසයක් නිරූපණයේදී භාව උද්දීපනයට වඩාත් උචිත ශරීරාංග වන්නේ …….. යි.

i. ප්‍රත්‍යංගයි ii. අංගයි iii. උපාංගයි iv. පංචාංගයි

02. 2 + 2 + 4 තාල රූපය හඳුන්වන නාමය …….. වේ.

i. සුළු මැදුම් මහ තුන්තිත ii. දෙසුළු මහ තුන්තිත
iii. සුළු දෙමැදුම් තුන්තිත iv. සුළු මැදුම් මහ තුන්තිත

03. උඩරට වන්නම් ප්‍රභවය ලබා ඇත්තේ …….. යුගයේදීය.

i. කෝට්ටේ යුගයේදීය ii. මහනුවර යුගයේදීය
iii. ගම්පොල යුගයේදීය iv. අනුරාධපුර යුගයේදීය

04. ග්‍රහපන්ති කවි ගායනයේදී තාල වාද්‍ය භාණ්ඩයක් ලෙස …….. යොදාගනියි.

i. තාලම්පට ii. අත්මිණිය iii. උඩැක්කිය iv. පන්තේරුව

05. ‘‘දඟර යෙදීම’’ , ‘‘ගැට යෙදීම’’ වැනි අලංකාර නර්තන රටා …… නර්තනයේදී භාවිතා කරයි.

i. මෝල්ගස් නර්තන ii. කඩු නර්තනය
iii. රබන් නර්තනය iv. ලී කෙළි නර්තනය

06. මූලික බීජාක්ෂර වාදනයේදී උඩරට බෙරයේ වම් ඇසේ ගැටිය අසලට ඇඟිලි අඟින් ගැසීමෙන් …….. ශබ්දය නිකුත් වේ.

i. තත් ii. පිත් iii. තොං iv. නන්

07. රසභාව පිළිබඳ භරතමුණි විසින් රචිත නාට්‍ය ශාස්ත්‍රය ග්‍රන්ථයේ ඇතුළත් වන්නේ රස …….. කි.

i. 9 ii. 7 iii. 8 iv. 5

08. කෘෂි කර්මාන්තය මූලික කරගනිමින් …….. ද්‍රවිඩ ගැමි නැටුම නිර්මාණය වී ඇත.

i. කුම්මි ii. සුලකු iii. අරවිවෙට්ටු iv. කරගම්

09. ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ ප්‍රථම ආචාර්ය උපාධිය ලබාගත් කාන්තාව ලෙස ..... හඳුන්වා දිය හැකිය.

i. ශ්‍රියානි රාජපක්ෂ මහත්මිය
ii. මිරැන්ඩා හේමලතා මහත්මිය
iii. වපිරා චිත්‍රසේන මහත්මිය
iv. ධම්මිකා ලංකාතිලක මෙනෙවිය

10. ‘‘විජයතුමා තම්මැන්නේ’’ ගීතයේ සංගීත නිර්මාණය ..... විසින් සිදුකරන ලදී.

i. ටිබෙට් ජාතික එස් මහින්ද හිමි
ii. සුදත් සමරසිංහ මහතා
iii. ජෝන්ද සිල්වා මහතා
iv. ලයනල් රන්වල මහතා

11. මේ අතරින් කෝළම් නර්තනය හා සම්බන්ධ නොවන්නේ,

i. තානායම් පොළයි
ii. වෙස් අත්තයි
iii. මඩුව (ලැගුම්ගෙය) යි
iv. තොරණ යි

12. මනිපුරි නර්තනයේ මූලික අභ්‍යාස ක්‍රමය හඳුන්වන්නේ

i. චාලි නම්නි
ii. අඩව් නම්නි
iii. කච්ච කෙට්ට අභ්‍යාස නම්නි
iv. ටුකඩා නම්නි

13. රූපවාහිනී මාධ්‍යතුල යොදාගන්නා තාක්ෂණික ශිල්ප ක්‍රමයක් නොවන්නේ,

i. අධිවේගී මන්දගාමී දර්ශන
ii. සමීප දුරස්ථ රූප
iii. විවිධ කෝණ
iv. ප්‍රේක්ෂකාගාරය

14. නර්තන, සංගීතය, චිත්‍ර යන මාධ්‍යයන්හි දැකිය හැකි සමානතා ලෙස සැලකිය හැක්කේ,

i. වින්දනය හා රිද්මයයි
ii. රිද්මය හා වර්ණයයි
iii. වින්දනය හා නාදයයි
iv. වින්දනය හා හැඩතලයයි


A


B


C


D

15. ඉහත රූප අතරින් පංචතූර්ය වාද්‍ය භාණ්ඩ වල ඝණ වාද්‍ය භාණ්ඩ ඇතුළත් රූප වන්නේ

i. A හා B රූපයි
ii. B හා C රූපයි
iii. B හා D රූපයි
iv. A, B, C රූපයි

16. ඉහත රූප සටහන් අතරින් සබ නැටුම් සඳහා භාවිත වාද්‍ය භාණ්ඩ වන්නේ

i. උඩැක්කිය හා පන්තේරුවයි
ii. උඩැක්කිය හා අත්මිණියයි
iii. බුම්මැඩිය, උඩැක්කිය හා පන්තේරුවයි
iv. අත් රබාන හා අත්මිණියයි

17. උඩරට, පහතරට, සබරගමු නර්තන සම්ප්‍රදායයන් තුනෙහිම දැකිය හැකි රංග ආභරණයක් ලෙස සැලකෙන්නේ

i. අවුල්හැරයයි
ii. ගෙප්පියි
iii. සිලම්බුයි
iv. නෙත්තිමාලයයි

18. ‘‘රන්වන් දුල් කරලින් පැසිලා .....’’ ගීතය අයත් චිත්‍රපටය වනුයේ,

i. සිකුරු තරුවයි
ii. මාතලයන්ය
iii. සිරි රජ සිරියි
iv. කුස පබාවතියි

19. දෙපානෝ ගීත නාට්‍යය නිර්මාණය කළේ

i. W.B. මකුලොලුව මහතා විසිනි
ii. ප්‍රේමසිරි කේමදාස මහතා විසිනි
iii. එදිරිවීර සරත්චන්ද්‍ර මහතා විසිනි
iv. චිත්‍රසේන මහතා විසිනි

20. ‘‘සිද්ධ මුනිඳු වැඩ හිඳ බෝමුල විදුරාසන’’ මෙය

i. සිරස පාද කවියක පද කොටසකි
ii. ගුහපන්ති කවියක පද කොටසකි
iii. කඩතුරා කවියක පද කොටසකි
iv. හටන් කවියක පද කොටසකි

★ **අංක 21 සිට 25 තෙක් ප්‍රශ්න සඳහා පිළිතුරු පහත වගුව ඇසුරින් තෝරන්න.**

	A	B	C	D
1	තබ්ලාව	සාරංගිය	මෘදංගය	පුංබෙරය
2	චෙන්ඩාව	පෙනා	පියානෝව	ගිටාරය
3	නටුවාංගම්	හාර්මෝනියම්	වීනාව	මද්දලය

21. භරත නර්තනය සඳහා භාවිතාකරන වාද්‍ය භාණ්ඩ සඳහන් වන්නේ

i. A – 1 සහ B - 2, සහ 3 තුළය
ii. A – 3 සහ C - 1, සහ 3 තුළය
iii. B – 2 සහ D - 2 තුළය
iv. C – 2 සහ B - 2 තුළය

22. කථක් නර්තනයේ ප්‍රධාන වාද්‍ය භාණ්ඩ සහ මනිපුරි නර්තනයේ ප්‍රධාන වාද්‍ය භාණ්ඩ දැක්වෙන වරණය කුමක්ද?

i. A – 1 සහ D - 1
ii. B – 1 සහ C - 2
iii. B – 1 සහ C - 3
iv. C – 1 සහ B - 3

23. කථකලි නර්තනයට අයත් වාද්‍ය භාණ්ඩ දැක්වෙන වරණය වන්නේ

i. A – 3 සහ B - 2
ii. A – 2 සහ D - 3
iii. C – 2 සහ D - 1
iv. B – 3 සහ D - 1

24. ඉහත B කොටසේ 1 සහ A කොටසේ 3 භාණ්ඩ භාවිතා වන නර්තන සම්ප්‍රදායන් ලෙස

i. කථකලි හා භරත නර්තන නම්කළ හැකිය
ii. මණිපුරි සහ කථක් නර්තන නම්කළ හැකිය
iii. කථකලි සහ මනිපුරි නර්තන නම්කළ හැකිය
iv. කථක් නර්තන හා භරත නර්තනය නම්කළ හැකිය

25. ඉහත වගුවේ සඳහන් භාණ්ඩ අතරින් ඉන්දියානු නර්තන සඳහා යොදා නොගන්නා වාද්‍ය භාණ්ඩ වන්නේ

i. හාර්මෝනියම් හා පෙනා යි
ii. පියානෝව හා ගිටාරයයි
iii. වීනාව සහ සාරංගියයි
iv. තබ්ලාව සහ පියානෝවයි

26. සේ ගී වලට අයත් නොවන ගායනාවකි

i. හටන් කවි
ii. ප්‍රශස්ති
iii. මල් යහන් කවි
iv. සංදේශ කාව්‍ය

27. සිකුරුතරුව, කුරුලුබැද්ද වැනි චිත්‍රපටවල නර්තන නිර්මාණය කළ නර්තන ශිල්පියා කවුද?

i. මුදියන්සේ දිසානායක මහතා
ii. චිත්‍රසේන මහතා
iii. චන්න විජේවර්ධන මහතා
iv. එස්. පනීභාරත මහතා


E


F


G


H

*** පහත 28 - 30 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමට ඉහත රූප සටහන් උපයෝගි කරගන්න.**

28. H රූපයේ දැක්වෙන අවස්ථාව අයත් වන්නේ

i. දෙවොල් මඩුවටයි
ii. කූඹි කතාව මුද්‍රා නාට්‍යටයි
iii. කෝළම් නාට්‍යයටයි
iv. කරදිය මුද්‍රා නාට්‍යයටයි

29. F රූපයේ දැක්වෙන නාටකය ප්‍රචලිත ප්‍රදේශ දෙකක් නම් කරන්න.

i. කළුන්දෑව, හඟුරන්කෙත
ii. ගාල්ල, මාතර
iii. මාතලේ, බලංගොඩ
iv. රත්නපුර, බටුවත්ත

30. සිසී සහ මන්නඩිරාළ චරිත ඇතුළත් වන්නේ

i. E රූපයේ ඇති නාට්‍යයටයි
ii. H රූපයේ ඇති නාට්‍යටයි
iii. F රූපයේ ඇති නාට්‍යයටයි
iv. G රූපයේ ඇති නාට්‍යටයි

II – කොටස උඩරට නර්තනය

31. උඩරට නර්තන සම්ප්‍රදායට ආවේණික පාරිභාෂික වචන වන්නේ

i. අඩව්ව, කස්තිරම, සීරුමාරුවයි
ii. අඩව්ව, සුරත්තට්ටුව, ඕඩියයි
iii. සීරුමාරුව, ගොඩ සරඹ, ඕඩියයි
iv. ගොඩ සරඹ, පා සරඹ, අඩව්වයි

32. වෙස් ඇදුම් කට්ටලයේ මැණික් කටුවට පළඳින ආභරණය වන්නේ

i. අත් පටියයි
ii. කෙමෙත්තයි
iii. බන්දි වළලුයි
iv. හැඩ කෑල්ලයි

33. හත්පද නර්තනයේදී භාවිතා කරන රංග භාණ්ඩ ලෙස

i. හක්ගෙඩිය, බුලත් අත සහ කොතලය නම් කල හැක
ii. බුලත් අත, නවකොළ අත්ත, අත්මිණිය නම් කළ හැක
iii. කොතලය, හොරනෑව හා පොල් පන්දම නම් කළ හැක
iv. කොතලය, බුලත් අත, දුම්මල කබල නම් කල හැක

34. 9 හා 11 ගොඩසරඹවල සරඹ නාමය වන්නේ

i. දෑත පෑගීමේ සරඹය හා පැනීමේ සරඹයයි
ii. බඹර සරඹය හා දෑල සරඹයයි
iii. අර්ධචක්‍ර සරඹය හා අංගහාර සරඹයයි
iv. දෑල සරඹය සහ පැනීමේ සරඹයයි

35. ගැටබෙරයේ වාදනයට වඩාත් සුදුසු බෙර පදය වන්නේ

i. පෙපෙඟ පෙපෙඟ පෙන පෙං කිට කුකුදත්
ii. පිංත පිමිත් තක් තක්කිට කිටි තකය
iii. රෙගුම් ගුදත් ගත් දෙගත් ගතකු දොම් ය
iv. රුංතක පිංතක පිංතක පිංකුද ය

36. කොහොඹා කංකාරියේ පමණක් දක්නට ලැබෙන නර්තන පෙළපාලි දෙකකි

i. යක් ඇනවුම, හත්පදය
ii. කොතලපදය හා මල්පදය
iii. ආවැන්දුම හා යක්තුන්පදය
iv. හත්පදය සහ අස්නෙ නර්තනය

37. තෙයිතක තෙයිතක තෙයිතක තෙයි මෙම පද කොටස

i. 10 වන පා සරඹයට අයත් වේ
ii. 11 වන පා සරඹයට අයත් වේ
iii. 9 වන පා සරඹයට අයත් වේ
iv. 12 වන පා සරඹයට අයත් වේ

38. දොදොංත තකු දොම් බෙරපදය වාදනය කරන උඩරට වන්නම

i. හනුමා වන්නමයි
ii. වෛරෝඩි වන්නමයි
iii. සැවුලා වන්නමයි
iv. සිංහරාජ වන්නමයි

39. පෙංතා පෙතා පෙනකුඳ පෙංත තා මෙම අඩව්ව අයත් වන්නේ

i. සිංහරාජ වන්නම
ii. තුරඟා වන්නම
iii. මුසලඩි වන්නම
iv. හනුමා වන්නම

40. කොහොඹා ලංකාරි ශාන්ති කර්මයේ පුද ලබන ප්‍රධාන දෙවිවරුන් වන්නේ

i. වීර මුණ්ඩ දෙවි, කොහොඹා දෙවිය
ii. වීර මුණ්ඩ දෙවි, දොවොල් දෙවිය
iii. කොහොඹා දෙවි, මංගර දෙවිය
iv. පත්තිනි දෙවි, විෂ්ණු දෙවිය

II – කොටස (පහතරට නර්තනය)

31. පහතරට නර්තන සම්ප්‍රදායට ආවේනික පාරිභාෂික වචන වන්නේ

i. ඉරට්ටිය, අන්තාඩිය සහ ඉලංගම් සරඹයි
ii. අඩව්ව, ඉරට්ටිය සහ සුරලයි
iii. කස්තිරම, කලාසම, ඉරට්ටියයි
iv. සීරුමාරුව, අන්තාඩිය සහ මාලක්කමයි

32. තෙල්මේ ඇදුම් කට්ටලයේ මැණික් කටුව අසල පළඳින ආභරණය වන්නේ

i. තෙල් කච්චියයි
ii. අත්ප්‍යි
iii. හස්තකඩයි
iv. බන්ධි වළලුයි

33. හත්පද නර්තනයේදී භාවිත රංග භාණ්ඩ ලෙස

i. හක්ගෙඩිය, කොලතය, පන්දම නම් කළ හැකිය
ii. අත්මිණිය, බුලත් අත, සංඛය නම් කළ හැකිය
iii. දුම්මල කබල, පොල්මල, වස්දණ්ඩ නම් කළ හැකිය
iv. කොතලය, බුලත් අත, දුම්මල කබල නම් කළ හැකිය

34. දෙතිතට අයත් සින්දු වන්නම් දෙකකි

i. නළු ගීතිකා තාලය නාතිලිංචි තාලය
ii. ශුද්ධ තාලය හනුමන්තා තාලය
iii. අනුරාග දණ්ඩ තාලය, ශුද්ධ තාලය
iv. ලලිතරාග තාලය, නළුගීතිකා තාලය

35. පහතරට බෙරයෙන් වාදනය කළ හැකි බෙරපදය වන්නේ

i. පිංත පිම්ත්තත් තක්කිට කිටිතක ය.
ii. පෙපෙඟ පෙපෙඟ පෙඟ පෙං කිට කුකුදත් ය.
iii. රුංතක පිංතක පිංතක පිංකුඳ ය.
iv. රෙඟුම් ගුදං ගත් දෙගත් ගතකු දොම් ය.

36. දෙවොල් මඩුවේ දැකිය හැකි නාට්‍යමය පෙළපාලි දෙකකි.

i. අසුර යක්කම, මරා ඉපැද්දවීම
ii. රාම යක්කම, දර්ශන යක්කම
iii. අඹ විදමන, මරා ඉපැද්දවීම
iv. දෙවොල් ගොඩ බැසීම, වැදි යක්කම

37. "ගුඳ ගති ගත" වට්ටමට අයත් තාල රූපය

i. 3 + 4 මැදුම් මහ දෙතිත වේ
ii. 2 + 4 සුළු මහ දෙතිත වේ
iii. 2 + 3 සුළු මැදුම් දෙතිත වේ
iv. 2 + 2 සුළු තනි තිත වේ

38. මාත්‍රා 2 + 2 + 4 තාල රූපයට නර්තනය කරන සිංදු වන්නම වන්නේ

i. ලලිතරාග තාලය සින්දු වන්නමයි
ii. අනුරාගදණ්ඩතාලය සින්දු වන්නමයි
iii. හනුමන්තා තාලය සින්දු වන්නමයි
iv. ශුද්ධ තාලය සින්දු වන්නමයි

39. තෙයි ගදිත ගත ගත් දිත් තොං නං මෙම පද කොටස

i. 10 වන පා සරඹයට අයත් වේ
ii. 09 වන පා සරඹයට අයත් වේ
iii. 12 වන පා සරඹයට අයත් වේ
iv. 11 වන පා සරඹයට අයත් වේ

40. පහතරට බෙරයේ විශේෂිත වූ ලක්ෂණයක් නම්

i. බෙරයේ දකුණු ඇසට සහ වම් ඇසට හරක්බොකු හම් යොදා ගැනීමයි
ii. බෙරයේ දකුණු ඇසට පමණක් හරක් බොකු හම් යොදා ගැනීමයි
iii. බෙරයේ දකුණු ඇසට හරක් හම් හා වම් ඇසට බොකුහම යොදා ගැනීමයි
iv. බෙරයේ දෙඇසටම හරක් හම යොදා ගැනීමයි

අ. පො. ස (සා/පෙළ) විභාග පෙරහුරු ප්‍රශ්න පත්‍රය

2025

පිළිතුරු පත්‍රය

01.	III	21.	II
02.	II	22.	I
03.	II	23.	II
04.	III	24.	IV
05.	I	25.	II
06.	III	26.	III
07.	III	27.	IV
08.	I	28.	II
09.	I	29.	I
10.	II	30.	IV
11.	IV	31.	I
12.	I	32.	II
13.	IV	33.	IV
14.	I	34.	I
15.	III	35.	IV
16.	I	36.	III
17.	III	37.	IV
18.	II	38.	IV
19.	I	39.	III
20.	III	40.	I

ඌව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
ஊவா மாகாண கல்வித் திணைக்களம்
Uva Provincial Department of Education

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය -2025 පෙරහුරු ප්‍රශ්න පත්‍රය

11 ශ්‍රේණිය		නැටුම් (දේශීය) - II	කාලය - පැය 03 යි

★ **පළමුවැනි ප්‍රශ්නය අනිවාර්ය වේ.**

★ **පළමුවැනි ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරක් ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.**

01. සියලුම ප්‍රශ්නවලට සුදුසු පිළිතුරු ඔබගේ පිළිතුරු පත්‍රයේ අදාල ප්‍රශ්න අංකය යොදා ඉදිරියෙන් ලියන්න.

i. අ. පො. ස. (උ/පෙළ) සඳහා නර්තනය විෂයයක් වශයෙන් ඇතුළත් වූයේ ……..
…… වසරේදීය.

ii. සිංහල නර්තන කලාව කෘතිය සම්පාදනය කරන් ලද්දේ ……. මහතා විසිනි.

iii. ගද්‍ය සහ පද්‍ය කොටස් දෙකකින් සමන්විත …….. සී පද ජන ගායනා විශේෂයකි.

iv. සූවිසි විවරණ, සත්සති ආදී බුදුගුණ ගායනය කෙරෙන පන්තේරු නර්තනය ……
…….. දෙවියන් හා බැඳෙන්නකි.

v. උඩරට නර්තන සම්ප්‍රදායේ හත් පද නර්තනය ගායනය ……. නර්තනයකි.

vi. නවග්‍රහයින් උදෙසා සිදු කරනු ලබන …….. ශාන්තිකර්මය නර්තන සම්ප්‍රදායන් තුනටම පොදු ශාන්තිකර්මයකි.

vii. මනිපුරි නර්තනයට යොදා ගන්නා ප්‍රධාන තත් වාද්‍ය භාණ්ඩය ……. නමින් හඳුන්වයි.

viii. “එහි දේවාල විහාරවල තේවාව සඳහා නියම වූ කුලවලින් පැමිණ කළගෙඩි සෙල්ලමේ යෙදෙන නළඟනනෝ වෙති” යනුවෙන් සටහන් කර ඇත්තේ මහනුවර යුගයේ ලංකාවට පැමිණි …….. විසිනි.

ix. මනිපුරි නර්තන සම්ප්‍රදායේ රාධාගේ රංගවස්ත්‍රාභරණ වලට අයත් කෙටිසාය හා හිසට පළඳින වේලය හඳුන්වන නාමයන් වන්නේ

i. කෙටිසාය - ……..

ii. හිසට පළඳින වේලය - ……..

x. පහත තාල රූපවලට අයත් වට්ටම් නම් කරන්න.

i. 2 + 2 + 4 - ……..

ii. 2 + 3 - ……..

02. i. මාත්‍රා 3+4 දෙතිතේ තාලයට උඩරට හෝ පහතරට හෝ සබරගමු සම්ප්‍රදායට අයත් බෙර පදයක් ප්‍රස්තාර කරන්න.

ii. පහත දැක්වෙන කවි පද මාත්‍රා තුනේ තනිතිතට (3+3) ප්‍රස්තාර කරන්න.

“අතකට ගෙන රබන් පොඩිය ගසති දිසි රුවින්”
ගත පිට බඳ සොලවා සිලි සිලි නද කරමින්

iii. සිංහරාජ වන්නමේ අඩව්ව හෝ අනුරාගදණ්ඩ තාලය සින්දු වන්නමේ ඉරට්ටිය හෝ විරාඩි වන්නමේ අඩව්ව ප්‍රස්තාර කරන්න.

03. පහත සඳහන් මාතෘකා අතුරෙන් තුනක් පිළිබඳව කෙටි සටහන් ලියන්න.

i. නමස්කාර ගාථා ii. අංග රචනය iii. හේවිසි වාදනය
iv. මිරැන්ඩා හේමලතා මහත්මිය v. නර්තනයෙන් ගොඩනැගෙන සාරධර්ම

04. දේශීය ශාන්තිකර්ම පිළිබඳ විමසීමේදී පූජාවිධි රටාවේ අන්තර්ගත පොදු ලක්ෂණ මෙන්ම අනන්‍යතා ලක්ෂණ ද පිළිබිඹු වේ.

i. කොහොඹා කංකාරියේ එන ගායනා රහිත ශාස්ත්‍රීය නර්තන අංග දෙකක් හඳුන්වන්න.

ii. දෙවොල් මඩුවේ සහ පහන් මඩුවේ සැරසිලිවල සමානතා සාකච්ඡා කරන්න.

iii. කොහොඹාකංකාරි ශාන්තිකර්මයෙන් සමාජයට ලබාදෙන පණිවිඩය පිළිබඳ විමසීමක් කරන්න.

05. i. සිංහල ගැමි නැටුමේ එන ලී කෙළි නැටුමට සමාන ද්‍රවිඩ ගැමි නැටුම නම් කර එම නැටුමෙහි විශේෂ ලක්ෂණ පිළිබඳව කෙටියෙන් පැහැදිලි කරන්න.

ii. කෝලම් නාටකයේ එන මානුෂ චරිතයක් නම් කර එම චරිත නිරූපණයෙන් සමාජශෝධනය වන ආකාරය පිළිබඳව විචාරයට ලක්කරන්න.

iii. සොකරි ගැමි නාටකයේ පුද ලබන දෙවිවරු දෙදෙනෙක් හා ප්‍රචලිත ප්‍රදේශ දෙකක් නම් කරන්න.

06. පහත දැක්වෙන රූප ඇසුරින් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.



A



B



C

i. A රූපයේ දැක්වෙන නර්තන සම්ප්‍රදාය සඳහන් කර නර්තන අංග තුනක් නම් කරන්න.

ii. B රූපයේ දැක්වෙන නර්තන සම්ප්‍රදාය නම් කර එය ආහාර්ය අභිනයෙන් පොහොසත් බවට කරුණු ඉදිරිපත් කරන්න.

iii. C රූපයේ දැක්වෙන කලා කෘතිය නම් කර එම නාටකයෙන් සමාජයට ලබාදෙන පණිවිඩය පැහැදිලි කරන්න.

07. i. අන්තර්ජාතික වශයෙන් නර්තන කලාව හැදෑරීමේ වැදගත්කම විස්තර කරන්න.

ii. නර්තන කලාව හැදෑරීමෙන් අත්පත් කරගත හැකි මානවීය ගුණාංග දෙකක් පිළිබඳ විස්තර කරන්න

iii. වේදිකා ප්‍රසංග අංගයක් නිර්මාණය කිරීමේදී සංවර්ධනය කළ හැකි කුසලතා 04 ක් පැහැදිලි කරන්න.

පිළිතුරු පත්‍රය

01. i. 1978
ii. මුදියන්සේ දිසානායක
iii. ටීකා
iv. පත්තිනි
v. රහිත
vi. බලි
vii. පෙනා / පෙනකොම්බා
viii. රොබට් නොක්ස්
ix. 1. පෝශ්වාන් 2. මයිකුම්
x. 1. කුදංත ගත දොම් වට්ටම
2. දොං පිංත ගත දොංත වට්ටම (ලකුණු 12)

02. i. අදාළ තිතට බෙරපදයක් ප්‍රස්තාර කර ඇත්නම්
ii. අදාළ තිතට ප්‍රස්තාර කර ඇත්නම්
iii. අඩව්වක් හෝ ඉරට්ටියක් ප්‍රස්තාර කර ඇත්නම් (ලකුණු 12)

03. මාතෘකා 03 ක් සඳහා කෙටි සටහන් ලියා ඇත්නම් (ලකුණු 12)

04. i. * යක්කැණුම * හත්පදයෙන් පද දෙකක්
* කෝල්පාඩුව * ආවැන්දුම
* දුනුමාලප්පුව
* යක්තුන්පදය ---- ආදී වශයෙන් නර්තනාංග දෙකක් නම් කර හඳුන්වා තිබේ නම්
(ලකුණු 04)

ii. ප්‍රධාන තොරණ
කාලපන්දම් ගස, මල්යහන් යනාදී සැරසිලි හඳුනාගෙන විස්තර කර ඇත්නම් (ලකුණු 04)

iii. පූර්ව චරිත්‍රවිධි, ශාන්තිකර්ම දින චාරිත්‍ර වාරිත්‍ර, නාට්‍යමය පෙළපාලි, උපත් කතාව ඇසුරෙන් සමාජයට ලබාදෙන පණිවිඩය පහත කරුණු ඇසුරෙන් විස්තර කර ඇත්නම්
* නායකත්වය * සංස්කෘතිය පවරාදීම
* වෛරය, පළිගැනීම වැනි සමාජ විරෝධී ක්‍රියාවලින් වැළකීම
* සමානාත්මතාවය

05. i. කෝලාට්ටම් නම් කර එහි ඇති සුවිශේෂී ගත් ලක්ෂණ ලියා ඇත්නම් ලකුණු පිරිනමන්න.
* පින්නල් කෝලාට්ටම් * සරල චලන ආදිය

ii. ජසයා, ලෙන්චිනා හෝ මුදලි, නොංචි මේ වැක් චරිතයක් නම් කර සමාජ ශෝධනය සිදුවන ආකාරය විස්තර කර ඇත්නම් (ලකුණු 04)

iii. දෙවිවරු - කතරගම දෙවි, පත්තිනි දේවිය

ප්‍රචලිත ප්‍රදේශ - උඩරට වන්නිය, හඟුරන්කෙත, මාතලේ

06. i. භරත නාට්‍ය
අලාරිප්පු, ජතීශ්වරම්, වර්ණම් යනාදී නම් ඇත්නම්

ii. කථකලි නම් කර ආහාර්ය අභිනය පිළිබඳ විස්තර කිරීම

iii. කූඹි කතාව
සාමූහිකත්වය
පරාර්ථකාමිත්වය
අන් අයගේ කරදරවලදී උදව් උපකාර කිරීම ආදිය විස්තර කර ඇත්නම්

07. i. * වෙනත් නර්තන සම්ප්‍රදායන්හි ගුණාත්මක ලක්ෂණ කෙරෙහි අවධානය යොමු කිරීමෙන් සාර්ථක නර්තන අංග බිහි කිරීමට හැකියාව ලැබීම

* විවිධ තාක්ෂණික උපකරණ මෙහෙයවීම හැකියාව ලැබීම හා ඒ අනුසාරයෙන් අංග සම්පූර්ණ නර්තන අංග නිර්මාණය කිරීමට හැකිවීම යනාදිය ලියා ඇත්නම්
(ලකුණු 04)

ii. ඉවසීම, නායකත්වය ආදිය නම් කර විස්තර කර ඇත්නම් (ලකුණු 04)

iii. නර්තන නිර්මාණකරණය
රංග වින්‍යාසය
රංග වස්ත්‍රාභරණ හා වේෂ නිරූපණය
වාදනය හා ගායනය
ආලෝකකරණය හා ශබ්ද පරිපාලනය
පෞරුෂය
වින්දන ශක්තිය මේවායින් 04 ක් නම් කර විස්තර කර ඇත්නම් (ලකුණු 04)